**ශීර්ෂය 242 - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 22 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 05 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත .මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ප්‍රතිපාදන නිෂ්ඵලවීම** | | |
| පුනරාවර්තන වැය විෂයකට හා මූලධන වැය විෂයයන් 02 කට සලසා තිබුණු එකතුව රු.2,200,000 ක ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | Covid 19 වසංගතය හේතුවෙන් අපේක්ෂිත පරිදි ප්‍රතිපාදන උපයෝජනය කරගැනීමට අවස්ථාවක් නොලැබුනු අතර රට තුළ පැවති මූල්‍යමය අර්බුදය හේතුවෙන් 2021 අගෝස්තු 30 දිනැති අංක 21/ 1596/ 304/ 134 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අපේක්ෂිත සමස්ත වියදම් නැවත සමාලෝචනය කර අවුරා තැබීමට සිදුවිය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම |
| **(ආ) අධි ප්‍රතිපාදන සලසා ගැනීම** | | |
| සමාලෝචිත වර්ෂයේදි පුනරාවර්තන වැය විෂයයන් 09 කට හා මූලධන වැය විෂයයන් 02 කට එකතුව රු.33,360,000 ක අධිප්‍රතිපාදන සලසා ගැනීම නිසා, 2021 වර්ෂය අවසානයේදී එකතුව රු.22,904,257 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එකතුව රු.10,455,743 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය එක් එක් වැය විෂයයන්ට සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 ක සිට සියයට 88 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | -එම- | -එම- |

| | | |
|---|---|---|
| **(ඇ) භෞතික වත්කම් අත්පත් කර ගැනීම**<br><br>2021 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ ගිණුම්ගත කළයුතු රු.297,000 ක් වූ හැකියා වර්ධනය සඳහා වූ වියදම ආයෝජන ක්‍රියාකාරකම්වල "භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්" යටතේ ගිණුම්ගත කර තිබුණි. | එකඟ නොවේ, හැකියා වර්ධනයට අදාළ අංක 2401 - කාර්යමණ්ඩල පුහුණු වැය විෂය ප්‍රාග්ධන ස්වරූපයේ වැයවිෂයක් වන අතර එය නිවැරදිව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 2021/ 03 හි සඳහන් උපදෙස් වලට අනුකූලව ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ ගිණුම් ගත කර ඇත. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් කරනු ලබන භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කරගැනීම් ප්‍රමාණය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේද ඇතුළත් කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 අගෝස්තු 15 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණයකට අනුව දෙපාර්තමේන්තුව විසින් කාර්තුමය වශයෙන් යාවත්කාලීන කරන ලද කාර්යමණ්ඩල වාර්තා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණි. 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම ක්‍රියාකාරී සැලැස්මෙහි මෙම කාර්යභාරය ඇතුළත් කර තිබුණි. මෙම අරමුණ යටතේ වන අපේක්ෂිත නිමවුම සමාලෝචිත වර්ෂයේදී ද ඉටු කර ගෙන නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | අර්බුදකාරී තත්ත්වයන්හි අතරතුර හා ඉන් පසුව රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 810 ක කාර්ය මණ්ඩල කාර්තු වාර්තා පෙර පරිදි ගෙන්වා ගැනීම සඳහා අප දෙපාර්තමේන්තුව විසින් අදාළ රාජ්‍ය ආයතන ලිපි මාර්ගයෙන් හා දුරකථන හා විද්‍යුත් තැපැල් මාර්ගයෙන් වරින් වර දැනුවත් කරමින් නිවැරදි හා යාවත්කාලීන වූ කාර්ය මණ්ඩල කාර්තු වාර්තා අවශ්‍ය පරිදි ගෙන්වා ගනිමින් 2021.12.31 දිනට කාර්ය මණ්ඩල කාර්තු වාර්තා මේ දක්වා සකස් කරමින් පවතී. කෙසේ වුවද රජයේ අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතනයන්හි 2020 වර්ෂයේ සිට නිරන්තරව සිදුවන ව්‍යුහාත්මක වෙනස්වීම් මත කාර්ය මණ්ඩල තොරතුරු නිවැරදිව යාවත්කාලීන කර ගැනීමේ ප්‍රායෝගික දුෂ්කරතාවයන් පැවතීම නිසා ඉදිරියේදී ඒ පිළිබඳව අමාත්‍ය මණ්ඩල දැනුවත් කර වාර්ෂිකව | දෙපාර්තමේන්තු කාර්යභාරයන් සැලසුම් වලට අනුකූලව ඉටුකළ යුතු වීම |

| | | | |
|---|---|---|---|
| | | යාවත්කාලීන කරන ලද වාර්තා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කරන බව දන්වමි. | |
| (ආ) | තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය සමාලෝචනය කළ යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම කාර්යභාරය අවසන් කර නොතිබුණි. | මහජනතාවගේ හා අනෙකුත් පාර්ශවයන්ගේ අදහස් ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් නම් කරනු ලබන විධිමත් කමිටුවක් පත්කර එම කමිටුවේ නිරීක්ෂණ හා නිර්දේශ පදනම් කරගෙන තැපැල් හා දුම්රිය සේවාවේ ප්‍රතිසංවිධාන කටයුතු සිදු කිරීම සුදුසු බවට ද 2017.12.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව පත්කළ නිලධාරී කමිටුව විසින් නිර්දේශ කර ඇත.<br>ඒ අනුව මෙම ආයතනයට අදාළව ආයතනික ව්‍යුහය, සේවක සංඛ්‍යා ව්‍යුහය පිළිබඳ පුළුල් සාකච්ඡාවක් සිදු කිරීමෙන් පසු කාර්ය මණ්ඩල සමාලෝචනය සිදු කිරීම යෝග්‍ය බව නිරීක්ෂණය කරන ලදි. එහෙත් පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රටේ තිබූ තත්ත්වය හේතුකොට ගෙන අදාළ දත්ත රැස් කර ගැනීම සඳහා නිලධාරීන් ඒකරාශී කර ගැනීමට නොහැකි වීම නිසා සමාලෝචනය සිදු කිරිමට නොහැකි විය. | සැලසුම් ප්‍රකාරව කාර්ය මණ්ඩලය සමාලෝචනය කළයුතු වීම |
| (ඇ) | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල කාර්යමණ්ඩල අනුමත කිරීමට අදාළ නිර්නායක සකස් කර නොතිබුණි. | දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ සඳහා කාර්යමණ්ඩලය අනුමත කිරීමට අදාළ නිර්නායක පිළිබඳ මූලික සාකච්ජාවක් ජාතික වැටුප් කොමිෂන් සභාව සමඟ මේ වන විටත් පවත්වා ඇති අතර ඒ අනුව සකසන ලද වාර්තාවක් ජාතික වැටුප් කොමිසමේ අවධානය පිණිස යොමු කර ඇත. | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල නිවැරදි ලෙස අනුමත කිරීම සඳහා නිර්ණායක සකස් කළ යුතු වීම. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත වූ තනතුරු 95 කින් තනතුරු 19 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු තනතුරු තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 13 ක් පැවතුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු වී පැවති අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි වැඩ ආවරණය සඳහා අධ්‍යක්ෂවරයෙකු පත්කිරීමෙන් සහ පුරප්පාඩු වී පැවති නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ තනතුරු වලට අදාළ රාජකාරී, සේවයේ නියුක්ත අධ්‍යක්ෂ හා නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ට පවරන ලදුව ඔවුන් තම රාජකාරී වේලාවන්ගෙන් පරිබාහිරව එම රාජකාරීයන්හි නියැළෙමින් එම කාර්යයන් ඉටුකළ හෙයින් කාර්යසාධනයට එහි සැලකිය යුතු බලපෑමක් ඇති නොවීය.<br><br>මානව සම්පත් කළමනාකරණ විශේෂඥ, වැඩ අධ්‍යයන විශේෂඥ සහ සංඛ්‍යාලේඛඥ යන තනතුරු සඳහා සුදුසු නිලධාරීන් අනුයුක්ත කර ගැනීමට නොහැකි වූ හෙයින් 2021 වර්ෂය තුළ ද එම තනතුරු පුරප්පාඩු වශයෙන්ම පැවතිණි. | පුරප්පාඩු පිරවීමට හෝ කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හෝ කටයුතු කළ යුතු වීම |